# පොලොන්නරු යුගයේ හින්දු මූර්තිවල විශේෂතා පිළිබඳ විමසීමක්

ඩබ්. ඒ. සුභාෂිණී වේරගොඩ[1]

පොලොන්නරු යුගයේ මූර්ති කලා නිර්මාණ අතුරෙන් හමු වන ශෛල, ලෝකඩ හා බදාම මාධ්‍යයෙන් කරන ලද හින්දු මූර්ති විශේෂත්වයක් උසුලයි. මේ යුගයේ පැවති සංස්කෘතික විපර්යාසය හා විදේශීය ආභාසය නිසා හෙළ කලාකරුවා භාරතීය කලා ශිල්පීය ලක්ෂණ මුසු කරගනිමින් මූර්ති නිර්මාණය කළ බව පෙනේ. මේ මුර්ති මධ්‍යම හා කාසි ප්‍රමාණයේ ප්‍රතිමා ලෙස හමු වී ඇත. ගලින් කරන ලද මුර්තිවලට වඩා ලෝකඩින් කරන ලද මූර්තිවල කලාත්මක විශේෂත්වයක් ඇත. මේ ලෝකඩ මූර්තිවල ශිව සහ පාර්වතී යන ද්විත්වය ප්‍රමුඛ ය. ඊට අමතර ව ශිවගේ විවිධ ආත්ම ද ශිව සාධුවරුන්ගේ ද පඤ්ච දේවතාවන්ගේ ද විෂ්ණු ප්‍රතිමා ද දක්නට ලැබේ. මේ මූර්තිවල එක ම දෙවියාගේ මූර්තිය වුව ද විවිධතා සහිත ව නිර්මාණය කිරීම හේතුවෙන් සෙසු මූර්ති අතර හින්දු මූර්තිවලට විශේෂත්වයක් හිමි වේ. හින්දු මූර්තිවලින් ප්‍රතීත මේ විවිධත්වයට හේතු වූ විශේෂ කාරණාවක් තිබිය යුතු ය. ඇතැම් විද්වතුන් අදහස් කරන පරිදි ශිල්පීය කුසලතාවන්හි විවිධත්වය මෙන් ම බැතිමතුන් ආකර්ෂණය කරගැනීමේ අරමුණු මේ සඳහා හේතු වී තිබේ. පොලොන්නරු යුගයට අයත් හින්දු මූර්ති නිරීක්ෂණයෙන් හා ඒ පිළිබඳ ලියවුණු විවිධ කෘති පරිශීලනයෙන් සිදු කළ මේ පර්යේෂණයට අනුව ඒ සඳහා වෙනත් හේතු ද බලපා ඇති බව අනාවරණය විය. හින්දු භක්තිකයන්ගේ සංස්කෘතිය විවිධ සැරසිලි අලංකරණයන්ගෙන් යුක්ත ය. ඒ නිසා ඔවුන් ඒ විවිධත්වය හා සංකීර්ණ ස්වරූපය තමා වන්දනාමාන කරන දෙවියන්ට ද ආරෝපණය කළ බව පෙනේ. හින්දු මූර්ති විවිධ අලංකරණ හා ආභරණ යොදා විසිතුරු ලෙස නිමවන්නට ඇත්තේ ඔවුන්ගේ සංස්කෘතික හේතු සාධක නිසා බව මේ අනුව හඳුනාගත හැකි ය.

**ප්‍රමුඛ පදඃ** හින්දු මූර්ති, බෞද්ධ මූර්ති, ශිව, විෂ්ණු, සංස්කෘතිය

[1] සිංහල අධ්‍යයනාංශය